# ගොවිකම් සඟරාව.

රටක මව ගොවිකම වේ.

MOTHER OF THE STATE

AGRICULTURE

භාගය 42. නො. 3-4, කතෘ:—සිරි බී. යටවර.

1947 ජූලි—දෙසැම්බර්.

## ලාංකික ස්ත්‍රිය හා කෘෂිකර්මය.

පුරාණයේ වාසය කළ ස්ත්‍රීහු ගොවිතම් දියුණුව උදෙසා තමන් ගෙන් ඉටු විය යුතු සේවය නොපිරිහෙළා ඉටු කළෝය. වෙනත් කටයුතු හැරුණු විට, ගොයම් නෙළීම, ගොයම් පැළ උදුරා නැවතත් සිටවීම, කැපූ ගොයම ගොඩ ගසා කමතට ගෙනයාම, පවුලේ ප්‍රයෝජනය පිණිස එළදෙනෙක ඇති කිරීම සහ ගෙවත්තේ එළවළු ආදිය වගා කිරීමත් ඔවුන්ගේ කටයුතු විය. කරුණු මෙසේ වෙතත්, ලංකාව ශිෂ්ටාචාරයෙන් දියුණු වීමේ ප්‍රතිඵලයක් වශයෙන්, පවුලේ දෛනික ආහාරය සෙවීමේදී සැමියාගේ සහකාරිය වීමට වඩා, ගෙදරට අලංකාරයක් වශයෙන් පැවැතීමට වර්තමාන ලාංකික ස්ත්‍රිය පුරුදු වී සිටී.

ද්විතීය ලෝක සංග්‍රාමයේදී පුරුෂ පක්ෂයෙන් වැඩි දෙනෙකු සිය රට උදෙසා සටන් කිරීමෙහි නියුක්තවූ කල, යුරෝපීය රටවල් අතුරෙන් වැඩි ගණනක ස්ත්‍රීහු පිටිසර පළාත්වල පිහිටි ගොවිපළවල කටයුතු කිරීමේ පුහුණුවක් ලබා ගත්තෝ ය. යාන්ත්‍රික උපකරණ පාවිච්චි කිරීමෙහි පවා ඔවුන් කොපමණ සමර්ථ වී දැ යි කියතොත් පුරුෂයන් නොසිටිද්දීත් තම රටවල ආහාර නිෂ්පාදනය දියුණු කිරීමට ඔවුනට පුළුවන් විය.

පේරාදෙණියේ කෘෂි කාර්මික කාන්තා අභ්‍යාස විද්‍යාලයය මින් දෙවසකට පෙර පිහිටුවන ලද්දේ අප තරුණ කාන්තාවන්ගේ සිත් කෘෂි කර්මය කෙරෙහි යොමු කරවීම පිණිස ය. මේ හැර, කෘෂිකර්මය පිළිබඳ විශෙෂ පුහුණුවක් ලබා ගැනීම සඳහා තරුණ කාන්තාවෝ කිහිප දෙනෙක් එංගලන්තයට ද යවනු ලැබූහ. පේරාදෙණියේ පිහිටි කෘෂි කාර්මික කාන්තා අභ්‍යාස විද්‍යාලයයේ ඉඩකඩ මඳ බැවින්, ශිෂ්‍යාවන් 120 දෙනකුට සෑහෙන අලුත් ගොඩනැගිල්ලක් ගොවිකම් දෙපාර්තමේන්තුව විසින් කුන්ඩසාලේ තනවා තිබේ. අක්කර 1,000ක් විශාල වූ ඉඩමක පිහිටුවා තිබෙන මේ පාසැලෙහි මෙ කාලට ඔබින පරිදි ඉඳුම් හිටුම් ලබා ගැනීම සඳහා ද කට යුතු සලස්වා ඇත්තේ ය. මෙහිදී බලාපොරොත්තු විය හැකි අධ්‍යයන මාර්ගයට කෘෂිකර්මයේ සියලු අංශ ද, සත්ව පාලනය ද, ගෘහ්‍ය කර්මය ද ඇතුළත් වන්නේ ය.

නොබෝදා ගොවිකම් දෙපාර්තමේන්තුවේ ප්‍රචාරක අංශය ගොවිකම් ප්‍රදර්ශකවරියන් තිදෙනෙකු පත් කළේ ය. මොවුහු, තමන් පුහුණුව ලබන කාලය අවසන් වීමෙන් පසු, ගොවි දිනයන්හිදී ප්‍රදර්ශන පවත්වනවාත් හැර, කාන්තා විද්‍යාල මහිලා සමිති හා වෙනත් කුලගන සමිති සමාගම්වලටත් ගොස්, නවීන වැවිලි ක්‍රම පිළිබඳ උපදෙස් ස්ත්‍රී පක්ෂයට ලබා දෙනවා ඇත.

අපගේ කාන්තා පක්ෂයේ සිත් කෘෂිකර්මය කෙරෙහි යොමු කරවීමට වුවමනා වැඩපිළිවෙළ ගොවිකම් දෙපාර්තමේන්තුව විසින් ස්ථිර ලෙස ආරම්භකොට තිබේ. කෘෂිකර්මය හා සත්ව පාලනයත් පිළිබඳ වඩා යහපත් ක්‍රම ඉගෙනීම සඳහා රජය මගින් තමන්ට සලස්වා දී තිබෙන පහසුකම්වලින් ප්‍රයෝජන ගෙන ලංකා මාතාව නැවත වරක් නැගෙණහිර ලෝකයේ ධාන්‍යාගාරය කිරීම ලාංකික ස්ත්‍රීන්ගේ යුතුකම බව මතක් කර සිටුම්හ.